" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

මගේ අංකය / எனது இலக்கம் / My No. - CSWP/ADM/18-38/FI/01-2021
ඔබේ අංකය / உமது இலக்கம் / Your No. -
දිනය / திகதி / Date - 2021.12.28

# මධ්‍යම රජයේ විවිධ අමාත්‍යාංශ වෙතින් ලැබෙන චක්‍රලේඛ (මූල්‍ය චක්‍රලේඛ හැර) බස්නාහිර පළාතට අදාළ කර ගැනීමේ කමිටුව

කමිටුව රැස්වූ දිනය - 2021.12.28

ස්ථානය - ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

සහභාගීත්වය - ඩබ්.එම්.දයාවතී මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

ඒ.එම්.එස්.මල්කාන්ති මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

ඩබ්.ටී.ඒ.මානෙල් මහත්මිය
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
ප්‍රධාන ලේකම් කාර්යාලය (බ.ප.)

| අනු අංකය | දිනය හා චක්‍රලේඛ අංකය | විස්තරය | නිර්දේශය |
|---|---|---|---|
| 01 | 2021.09.14<br>02-80/20121 | රජයේ ලියාපදිංචි වෛද්‍ය නිලධාරීන් සඳහා වෛද්‍ය විද්‍යාල සභාව විසින් වසරක් පාසා පැවැත්විය යුතු ප්‍රවීණතා ඩිප්ලෝමා විභාගය 1997 වසරේ සිට නොපැවැත්වීම හේතුවෙන් සිදුවූ අසාධාරණය නිවැරදි කිරීම පිණිස ලියාපදිංචි වෛද්‍ය සේවයේ 1 වන ශ්‍රේණියට උසස් කිරීමට ගතවන කාලය සංශෝධනය කිරීම | මෙම චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාළ කර ගැනීම සුදුසු බව නිර්දේශ කරමු. |

| | | | |
|---|---|---|---|
| 02 | 2021.10.06<br>රා.ප. චක්‍රලේඛ 20/2021 | රාජ්‍ය ආදායම ඇස්තමේන්තු කිරීම,එකතු කිරීම,අධීක්ෂණය සහ වාර්තා කිරීම පිළිබඳ මාර්ගෝපදේශ (රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී - 20.02.01.01) | මෙම චක්‍රලේඛ පළාතට අදාල නොමැති වුවද පළාතට ගැළපෙන ලෙස වෙනස් කර නව චක්‍රලේඛයක් ලෙස නිකුත් කිරීමට නිර්දේශ කළ අතර ඒ සඳහා පාලන,මූල්‍ය හා නීති යන අංශ නියෝජනය වන පරිදි සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර කෙටුම්පත සකස් කිරීමට උපදෙස් ලබා දුනි. |
| 03 | 2021.12.02<br>රා.ප. චක්‍රලේඛ 24/2021 | රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01" සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2021.12.31 | |
| 04 | 2021.12.20<br>රා.ප. චක්‍රලේඛ 25/2021 | 2022 වසර - රාජකාරී කටයුතු ඇරඹීම | මෙම චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාල කර ගැනීම සුදුසු බව නිර්දේශ කරමු. |
| 05 | 2021.11.22<br>රා.ප. චක්‍රලේඛ 22/2021 | රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය | මෙම චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාල කර ගැනීම සුදුසු බව නිර්දේශ කරමු. |
| 06 | රා.ප. චක්‍රලේඛ 26/2021 | රජයේ නිලධරයන්ට විශේෂ අත්තිකාරම් - 2022 වසර | මෙම චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාල කර ගැනීම සුදුසු බව නිර්දේශ කරමු. |
| 07 | රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02-2021 | අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ නොකිරීම මත උසස්වීම් නොලබා විශ්‍රාම ගිය නිලධාරින් සඳහා ශ්‍රේණි උසස් වීම් ලබා දීම | මෙම චක්‍රලේඛය පවතින ආකාරයෙන්ම බස්නාහිර පළාතට අදාල කර ගැනීම සුදුසු බව නිර්දේශ කරමු. |

ඩබ්.එම්.දයාවතී මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන) ..........................

කමිටු සභාපති

ජේ.එම්.එස්.මල්කාන්ති මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ..........................

කමිටු සාමාජික

ඩබ්.ටී.ජේ.මානෙල් මහත්මිය - නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) ..........................

කමිටු සාමාජික

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2021

මගේ අංකය : F/FR/03/BRCir
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.12.02

අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී "20.02.01.01." සඳහා හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම - 2021.12.31</u>**

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 01/2015 හා 2015.07.20 දිනැති චක්‍රලේඛයට (https://www.treasury.gov.lk/api/file/9b53869c-39ec-48b9-a16b-609a0e01a9e5) හා එහි සංශෝධන වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් කටයුතු කරනු ලබන ආදායම් සංකේතාංක 20.02.01.01 වන රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් එකතු කිරීමේ වගකීම පැවරී ඇති ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්/ ගණන්දීමේ නිලධාරින් විසින් මු.රෙ.128 (2) (ඇ) විධිවිධාන ප්‍රකාරව එකී ආදායම් සංකේතාංකයට අදාළව හය මසකට වරක් හිඟ ආදායම් පිළිබඳ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව ඇත.

03. එබැවින් 20.02.01.01. වන රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී ආදායම් සංකේතාංක යටතේ නියමිත නීති සහ රෙගුලාසි ප්‍රකාරව නඩත්තු කරන ලද හිඟ ආදායම් සම්බන්ධ ගිණුම් පොත් නිසි පරිදි සංසන්දනය කර ඉහත සඳහන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 පරිදි අමුණා ඇති ආකෘති පත්‍ර අංක 01ට අනුව 2021.12.31 දිනට සකස් කරන ලද හිඟ ආදායම් වාර්තා 2022.01.14 දිනට පෙර "buildingrentpubad@gmail.com" යන විද්‍යුත් තැපැල් ලිපිනයට මෘදු පිටපතක් ද සහිතව මෙම අමාත්‍යාංශයෙහි "ප්‍රධාන මූල්‍ය නිලධාරී" වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. අදාළ දිනට හිඟ ආදායම් කිසිවක් නොමැති නම් ඒ බව සඳහන් කරමින් හිස් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වේ.

04. තවද, එක් එක් වර්ෂයට අදාළ හිඟ ආදායමට අනුරූපීව 2021 වර්ෂය තුළ රැස්කරන ලද මුදල් පිළිබඳ විස්තර ද එම කාලච්ඡේදය තුළදී මු.රෙ.113 පරිදි භාණ්ඩාගාරයෙන් ලද අනුමැතිය ප්‍රකාරව අතහරින ලද හිඟ ආදායම් වේ නම් ඒ සම්බන්ධ විස්තර ද අමුණා ඇති ආකෘති පත්‍ර 02 පරිදි ඉදිරිපත් කළ යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත් :- 1. විගණකාධිපති
2. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

ආකෘති පත්‍ර අංක - 01

# 2021.12.31 දිනට හිඟ ආදායම් පිළිබඳ වාර්තාව

I. ව්‍යවස්ථාව /අධිකාරිය - ආයතන සංග්‍රහය / ඉඩම් සංවර්ධන ආඥා පනත / රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: **24 /2021**

II. ව්‍යවස්ථාපිත අධිකාරිය - රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

III. ආදායම් අයිතමය - රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී

IV. ආදායම් සංකේතාංකය - **20.02.01.01.**

| විස්තරය (රජයේ ගොඩනැගිලි කුලී ආදායම් වර්ගීකරණය) (1) | හිඟ ආදායම් 2018.12.31 දින දක්වා සමුච්චිත හිඟ මුදල රු. (2) | 2019 වසරට අදාල හිඟ මුදල රු. (3) | 2020 වසරට අදාල හිඟ මුදල රු. (4) | 2021 වසරට අදාල හිඟ මුදල රු. (5) | 2021.12.31 දක්වා මුළු හිඟ මුදල (2 +3 + 4 +5) රු. (6) | හිඟ සඳහා හේතු * (7) | හිඟ අයකර ගැනීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග * (8) | හිඟ අයකර ගැනීමට ඇති හැකියාව පිළිබඳ සහතිකය * (9) |
|---|---|---|---|---|---|---|---|---|
| i. නිල නිවාස | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි/ගබඩා | | | | | | | | |
| iv. වෙනත් ගොඩනැගිලි (ආපනශාලා ඇතුලත්ව) | | | | | | | | |
| එකතුව | | | | | | | | |

**2021.06.30** දිනට ඉදිරිපත් කළ හිඟ ආදායම් වාර්තාව මගින් ඉහත වගුවේ තීරු අංක **2** සිට **4** දක්වා වාර්තා කරන ලද එක් එක් හිඟ මුදල් වලින් **2021** වර්ෂය තුලදී අයවීම් ඇතොත් ඒවා අඩු කළ පසු ලැබෙන මුදලට මෙම තීරු යටතේ වන එකතුන් සමාන විය යුතුවේ. එසේ නැතහොත් අදාල වෙනස්කම් සඳහා විස්තරාත්මක හේතු ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම සුදුසු වේ.

*** 7, 8** සහ **9** තීරු සඳහා වලංගු පැහැදිලි හේතූන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. ඒ සඳහා ආකෘතියේ ඇති ඉඩ ප්‍රමාණවත් නොවේ නම් ඇමුණුමක් ලෙස ඉදිරිපත් කිරීම සුදුසුවේ.

සැ.යු. :- හිඟ ආදායම් දැක්වීමේදී ඉහත වර්ගීකරණය යටතේ ඉදිරිපත් කිරීමට සැලකිලිමත් වන්න.

දිනය - ..............................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..........................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්
(නිල මුද්‍රාව)

## 2021.12.31 දිනට හිඟ ආදායම් එකතු කිරීම් පිළිබඳ සහ අනුමත ආදායම් අතහැරීම් පිළිබඳ ප්‍රකාශය

**අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව :** **ආදායම් සංකේතාංක : 20.02.01.01.**

| විස්තරය | 2021 වර්ෂය තුල හිඟ ආදායම් එකතු කිරිම | | | | * 2021 වර්ෂය තුල හිඟ ආදායම් අත්හැර දැමීම් | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2018.12.31 දක්වා | | 2019 | | 2020 | | |
| | 2018.12.31 දින දක්වා හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම් | 2019 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | 2020 වසරට අදාල හිඟ මුදලට අනුරූපීව එකතු කිරීම | හිඟ මුදලට අදාලව මුළු එකතු කිරීම් (2+3+4) | හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | වසරට අදාල හිඟ මුදලට අනුරූපීව අත්හැර දැමීම් | මු.රෙ. 113 ප්‍රකාරව අත්හැර දැමීම් සඳහා බලය දුන් භාණ්ඩාගාර ලිපි යොමුව සහ දිනය | හිඟ මුදලට අදාලව අත්හැර දැමීම්වල මුළු එකතුව (6+8+10) |
| | රු. | රු. | රු. | රු. | රු. | | රු. | | රු. | | රු. |
| (1) | (2) | (3) | (4) | (5) | (6) | (7) | (8) | (9) | (10) | (11) | (12) |
| i. නිළ නිවාස | | | | | | | | | | | |
| ii. සංචාරක බංගලා හා නිවාඩු නිකේතන | | | | | | | | | | | |
| iii. වාණිජ ගොඩනැගිලි/ගබඩා | | | | | | | | | | | |
| iv. වෙනත් ගොඩනැගිලි (ආපනශාලා ඇතුලත්ව) | | | | | | | | | | | |

* මෙම ආදායම් සංකේතාංකය යටතේ වන යම් කිසි ආදායම් අත්හැර දැමීමක් සඳහා මු.රෙ. 113 ප්‍රකාරව භාණ්ඩාගාරයෙන් පූර්ව අනුමැතිය ලබා ගත යුතුවේ. එබැවින් මේ යටතේ සඳහන් කළ යුත්තේ එසේ භාණ්ඩාගාරයේ (රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව) අධිකාර බලය ලබාගත් අත්හැර දැමීම් වන අතර ඒ සඳහා අදාල එක් එක් බලය දීමේ ලිපියේ පිටපතක් ද මේ සමඟ ඇමිණිය යුතුවේ.

දිනය :- ..............................

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

..............................................................

ලේකම්/දෙපාර්තමේන්තු ප්‍රධානියා/දිස්ත්‍රික් ලේකම්

(නිල මුද්‍රාව)